# සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
## கலாசார அலுவல்கள் திணைக்களம்
## Department of Cultural Affairs

8 වන මහල සෙත්සිරිපාය බත්තරමුල්ල 8ஆம் மாடி, செத்சிறிபாய, பத்தரமுல்ல.8th floor,Sethsiripaya, Battaramulla

සොඳුරු දේශයක පෙරගමන්කරු வளமான தேசத்தை நோக்கி முன் செல்பவர். *Trailblazer of a Beautiful Nation*

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | DCA/06/11/08/01 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2017/01 17 |

නිවුණු හැදුණු පිරුණු සොඳුරු මිනිසුන් පිරි පින්බර දේශයක් එක්ව ගොඩනගමු

அமைதியான, ஒழுக்கமான, முழுமையான சிறந்த மனிதர்களைக் கொண்ட தேசத்தை ஒன்று சேர்ந்து கட்டியெழுப்புவோம்.

Towards building a blessed nation of compassionate, complete and culturally rich human beings

දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක :-05/2017

දිස්ත්‍රික් ලේකම් මගින්,
ප්‍රාදේශීය ලේකම් මගින්,
දිස්ත්‍රික් සංස්කෘතික නිලධාරී/සංස්කෘතික නිලධාරී/ සංස්කෘතික සංවර්ධන සහකාර/
සංවර්ධන නිලධාරී,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

### පෙරහැර හා විවිධ උත්සව සඳහා ආධාර ගෙවීම

නිවුණු හැදුණු පිරුණු සොඳුරු මිනිසුන් පිරි පින්බර දේශයක් එක්ව ගොඩ නැගීම සඳහා වූ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තු දැක්ම පෙරදැරිව ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා බැඳුණු කලාංග ප්‍රවර්ධනය උදෙසා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් පෙරහැර හා විවිධ උත්සව සඳහා ආධාර ලබාදීම සිදු කරනු ලබයි.

**01.** පෙරහැර සඳහා ආධාර ගෙවීම

පෙරහැර සඳහා ආධාර ගෙවීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

i. අදාල පෙරහැර ඓතිහාසික වැදගත්කමක් සහිත පෙරහැරක් විය යුතුය.
ii. අදාල කොට්ඨාශය භාර සංස්කෘතික නිලධාරී පෙරහැර පිළිබඳව දැනුවත් විය යුතු අතර, ආධාර මුදල් ඉල්ලුම් කිරීමේදී ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය.
iii. පෙරහැර පහත සඳහන් කුමන වර්ගයට අයත් පෙරහැරක්ද යන වග ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් විසින් සඳහන් කළ යුතුය.
    I. ප්‍රාදේශීය මට්ටමේ පෙරහැර සඳහා - රු. 10 000.00
    II. දිස්ත්‍රික් මට්ටමේ පෙරහැර සඳහා - රු. 15 000.00

❖ මේ සඳහා වන ආධාර ගෙවීමේදී අදාළ චෙක්පත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය /දිස්ත්‍රික් ලේකම් කාර්යාලය නමින් හෝ සෘජුව ඉදිරිපත් වන ඉල්ලීමකදී අදාළ පෙරහැරට අදාළ බෞද්ධ සංගමය නමින් නිකුත් කළ යුතුය.

**02.** විවිධ උත්සව සඳහා ආධාර ගෙවීම

විවිධ උත්සව සඳහා ආධාර ගෙවීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

i. දේශීය සම්ප්‍රදායික සංස්කෘතිකාංග ඇතුළත් උත්සවයක් බවට ප්‍රාදේශීය ලේකම්/ සංස්කෘතික නිලධාරී/ සංස්කෘතික සංවර්ධන සහකාර/සංවර්ධන නිලධාරී සෑහීමකට පත්විය යුතුය.

අධ්‍යක්ෂ பணிப்பாளர் 2872035 කාර්යාලය அலுவலகம் 2872031 ෆැක්ස් தொலைநகல் 2866732 ඊ-මේල් மின்னஞ்சல் dcanews@sltnet.lk වෙබ් ලිපිනය இணையத்தளம்

"ii. විශේෂ ගුණ සමරු උත්සවවලදී එයට භාජනය වන තැනැත්තා කලා ක්ෂේත්‍රයේ ප්‍රවීණ විශේෂිත පුද්ගලයෙකු විය යුතුය. ( ජාතික මට්ටමෙන් පිළිගත් කලාකරුවන්, සංස්කෘතිකමය වටිනාකමක් ඇති ක්ෂේත්‍රවල නියැලුණු ප්‍රවීණයින් )

iii. ගෙවනු ලබන ආධාර මුදල් පහත පරිදි වේ.

I. විශේෂ ගුණ සමරු උත්සව සඳහා - රු. 25 000.00

II. දේශීය සම්ප්‍රදායික සංස්කෘතිකාංග ( දහඅට සන්නිය, සත්පත්තිනි, කොහොඹා කංකාරිය, ගම්මඩු, වැදි නැටුම් ආදී ) ඇතුළත් උත්සව සඳහා - රු. 10 000.00

III. සංස්කෘතික හා කලාත්මක වටිනාකමකින් යුත් සංස්කෘතිකාංග ඇතුළත් උත්සව සඳහා - රු. 5 000.00

ගෙවීම් සිදුකරන වර්ෂය උදෙසා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතුව පවතින ප්‍රතිපාදන මත සියලු ආධාර ගෙවීම් සිදු කරනු ලබන බව සැලකිය යුතුය.

කිසියම් අවස්ථාවකදී මෙම ආධාර මුදල් අදාළ ආධාරලාභීන් වෙත ගෙවීමට නොහැකි වුවහොත් ඊට හේතු දක්වා ඊළඟ මුදල් වර්ෂය ආරම්භ වීමට පෙර සංස්කෘතික අධ්‍යක්ෂ නමට ලියූ චෙක්පතකින් ආපසු එවිය යුතුය.

දෙපාර්තමේන්තුව වෙත ඉහත කරුණුවලට අදාළව සෘජුවම ඉදිරිපත්වන ඉල්ලීම්වලදී අදාළ ඉල්ලීම පිළිබඳ සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂගේ නිර්දේශය මත චක්‍රලේඛ ප්‍රකාරව ගෙවීම් සිදුකරන අතර අදාළ උත්සවය සිදුකෙරෙන සංගමය නමින් චෙක්පත් නිකුත් කිරීම සිදු කෙරේ.(පුද්ගල නාමයන් සඳහා චෙක්පත් නිකුත් නොකරන බවද සැලකිය යුතුය.)

අනුෂා ගෝකුල ප්‍රනාන්දු
සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ

පිටපත් 1.ලේකම්,අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය - දැ.ගැ.ස

2.ගණකාධිකාරී -කරු. 9-1508 දිස්ත්‍රික් සංස්කෘතික වැය විෂය යටතේ ගෙවීම් කිරීම සහ අ.ක.ස